රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Services, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන தொலைபேசி:(94) 011- 2694560 Telephone
ෆැක්ස් தொலைநகல்:(94) 011- 2692254 Fax
ඊ-මේල් மின்னஞ்சல்:dgcs@pubad.gov.lk E-mail
වෙබ් අඩවිය இணையத்தளம்: www.pubad.gov.lk Web Site

---

මගේ අංකය எனது இல My No: CS/DOS/Policy/04
ඔබේ අංකය Your No:
දිනය திகதி Date: 2021.12.09

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කරන ලද/ අන්තර්ග්‍රහණය කිරීමට නියමිත නිලධරයන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් සහන ලබාදීම</u>**

සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවෙහි 14වන ඡේදය ප්‍රකාරව සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්හට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම සඳහා සහන ලබා දීම සම්බන්ධයෙනි.

02. සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කිරීමේදී පහත දැක්වෙන කාණ්ඩවල නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සම්බන්ධයෙන් සහන ලබා ගැනීමට ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය විය.

i. පූර්ව බඳවා ගැනීම් පටිපාටියේ/ පත්වීම් ලිපියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පිළිබඳ සඳහන් නොමැති වීම නිසා කිසිදු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයක් සමත්ව නොමැති නිලධාරීන්.
ii. පූර්ව බඳවා ගැනීම් පටිපාටියේ/ පත්වීම් ලිපියේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සම්පූර්ණ කර නොතිබීම මත සහන ලබාගැනීමට ඉල්ලීම් ඉදිරිපත් කර ඇති නිලධාරීන්
iii. 2011.08.01 දිනට පසුව හා අන්තර්ග්‍රහණ ලිපිය නිකුත් කිරීමට පෙර පූර්ව බඳවා ගැනීම් පටිපාටියේ/ පත්වීම් ලිපියේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව ඇති නිලධාරීන්.
iv. පූර්ව බඳවා ගැනීම් පටිපාටියේ/ පත්වීම් ලිපියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් නොවීම මත පූර්ව තනතුරේ සේවය ස්ථිර කර නොමැති සහ සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වීමෙන් පසු සංවර්ධන නිලධාරි සේවයේ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූ නිලධාරීන්
v. 2011.08.01 දින සිට සංවර්ධන නිලධාරි සේවයේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලදුව එදින සිට වසර 3ක් ඉක්මවීමෙන් පසු සංවර්ධන නිලධාරී සේවයේ දෙවන කාර්යක්ෂමතා පරීක්ෂණය සමත් වූ නිලධාරීන්.

03. සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා පරීක්ෂණ සහන ලබා ගැනීමට ඉදිරිපත් කල අභියාචනා සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් උපදෙස් ලබා ගැනීමට කටයුතු කළ අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/APP/04/2021 හා 2021.08.13, PSC/APP/4/2/2016 හා 2020.10.23 දිනැති ලිපි වලින් දන්වා

ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ අනුව සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කරන ලද /කිරීමට නියමිත නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලට අදාළව සහන හිමිවන ආකරය ඇමුණුම 01 මඟින් දක්වා ඇති අතර ඒ පිලිබදව අදාළ නිලධාරීන් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.

04. සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්, සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය වන 2011.08.01 දිනට පෙර සේවය කරන ලද පූර්ව තනතුරේ බඳවා ගැනීම් පටිපාටියේ/පත්වීම් ලිපියේ දැක්වෙන පළමු කාර්යක්ෂමතා පරීක්ෂණය නියමිත කාලසීමාව තුළ සමත් විය යුතු අතර වසරකට විභාග වාරයක් පැවැත්විය යුතුය යන පදනම මත නියමිත වාර ප්‍රමාණය ගණනය කරනු ලබන බව රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APP/04/2021 හා 2021.08.13 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.

05. තවද රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය අනුව පූර්ව සේවයේ III ශ්‍රේණියේ තනතුරක සිට සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියේ තනතුරකට 2011.08.01 දින සිට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන්, අන්තර්ග්‍රහණ ලිපිය නිකුත් කල දින සිට වසර 3ක් ඇතුළත සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කල යුතු අතර වසරකට විභාග වාර 2ක් පැවැත්විය යුතුය යන පදනම මත නියමිත වාර ප්‍රමාණය ගණනය කරනු ලැබේ. මේ වන තෙක් සංවර්ධන නිලධාරි සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වාර 2ක් පමණක් (2018.04.21 හා 2020.01.19 යන දිනයන්හි) පවත්වා ඇති බැවින් හා එම පරීක්ෂණයන්හි ප්‍රතිඵල නිකුත් කර ඇති බැවින් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2016හි 4 ඡේදයේ අනු අංක 4 අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් හා පහත අවශ්‍යතා සම්පූර්ණ කර ඇති සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන්ගේ පමණක් වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

i) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ප්‍රතිඵල නියමිත ආකෘතිය මඟින් අදාළ නිලධාරියා වෙත දන්වා තිබීම
ii) නිලධාරියාගේ කාර්ය සාධන වාර්තා නිසි පරිදි සම්පූර්ණ කර ඇගයුම්කරු හා ප්‍රමාණකරු නිසි පරිදි ප්‍රමානණය කර තිබීම.
iii) වාර්ෂික වැටුප් වර්ධකයක් ගෙවීමට අදාළ අනෙකුත් සියලුම අවශ්‍යතා නියමිත පරිදි සපුරා තිබීම

06. එසේම සංවර්ධන නිලධාරි සේවයේ II හා I ශ්‍රේණිවලට උසස්වීමට අදාළ සුදුසුකම් සපුරා තිබීම මත නිලධාරීන්ගේ උසස්වීම් දිනය ගණනය කිරීමේදී 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නිකුත් කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හා එහි අනුශාංගික චක්‍රලේඛ විධිවිධාන කෙරෙහි අවධානය යොමු කළ යුතු බවද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

**සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ට සේවා ව්‍යවස්ථාවේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සම්පූර්ණ කිරීම සඳහා සහන සැලසීම**

**1වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

| 1. පූර්ව තනතුරට අදාල බඳවා ගැනීම් පටිපාටියේ/පත්වීම් ලිපියේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සම්බන්ධයෙන් සඳහන් නොවන නිලධාරීන් සඳහා 1වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කිරීම සඳහා සහන ලබාදීම. | | |
|---|---|---|
| **සහන ලබාදීමට අදාල නිලධාරී කාණ්ඩය** | | **සහනය** |
| **i.** | පූර්ව තනතුරේ බඳවා ගැනීම් පටිපාටියේ/පත්වීම් ලිපියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සම්බන්ධයෙන් සඳහන් නොවන පත්වීම ස්ථිර කර නොමැති නිලධාරීන් | පූර්ව තනතුරේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් නොවූ නිලධාරීන්, සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවේ 10 වන ඡේදයේ දක්වා ඇති, සංවර්ධන නිලධාරී සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය, අන්තර්ග්‍රහණ ලිපිය නිකුත් කල දින සිට වසර 3ක් තුළ සමත්විය යුතු අතර එම කාලය තුළ වසරකට විභාගවාර 2ක් පැවැත්විය යුතුය යන පදනම මත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුවාර ප්‍රමාණය ගණනය කරනු ලබයි. |
| **ii.** | පූර්ව තනතුරේ බඳවා ගැනීම් පටිපාටියේ/පත්වීම් ලිපියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සම්බන්ධයෙන් සඳහන් නොවන එහෙත් පත්වීම ස්ථිර කර ඇති නිලධාරීන් | |
| **iii. පත්වීම ස්ථිර කිරීම සම්බන්ධ කරුණු** | සේවයේ ස්ථිර කිරීමට අදාළ සියලු අවශ්‍යතා සම්පූර්ණ කර ඇති පූර්ව තනතුරේ සේවය ස්ථිර නොකල නිලධාරීන්ගේ සේවය ස්ථිර කිරීම පිලිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානීන් තම නිර්දේශ යොමු කිරීමේදී නිලධාරියාගේ පත්වීම් දින සිට 2009.04.02 දක්වා නිර්දේශ ආයතන සංග්‍රහය අනුවද 2009.04.02 සිට පරිවාස කාලය අවසන් වන දින දක්වා නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති සංග්‍රහය අනුවද යොමු කල යුතුය. | |
| **iv. ශ්‍රේණිගත උසස්කිරීම සම්බන්ධ කරුණු** | a) නියමිත වාර ගණන තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමට අපොහොසත් වන නිලධාරීන්ගේ වාර්ෂික වැටුප් වර්ධක විලම්භනය වේ.<br>b) නියමිත වාර ගණන තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී ඇති නිලධාරීන් අනෙකුත් නියමිත සුදුසුකම් සපුරා තිබේනම් නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූ සේ සලකා පූර්ව සේවයට ඇතුළත් වී වසර 10ක සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දින සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබේ. | |

| සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ට සේවා ව්‍යවස්ථාවේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සම්පූර්ණ කිරීම සඳහා සහන සැලසීම<br>**1වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය** |
|---|

| 2. පූර්ව තනතුරේ බඳවා ගැනීම් පටිපාටියේ/පත්වීම් ලිපියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය හෝ සංවර්ධන නිලධාරී සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කිරීම මත සහන සැලසීම. | | |
|---|---|---|
| **සහන ලබාදීමට අදාල නිලධාරී කාණ්ඩය** | | **සහනය** |
| **i.** | පූර්ව තනතුරට අදාල බඳවා ගැනීම් පටිපාටියේ/පත්වීම් ලිපියේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2011.08.01 දිනට පසු හා අන්තර්ග්‍රහණ ලිපිය නිකුත් කිරීමට ප්‍රථම සම්පූර්ණ කර ඇති නිලධාරීන් | නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවේ 10වන ඡේදයේ දක්වා ඇති සංවර්ධන නිලධාරී සේවයේ IIIශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවක් නොමැත.<br><br>තවද, නිලධාරියාට පෙනීසිටීමට හැකියාව තිබූ පූර්ව තනතුරට අදාල බඳවා ගැනීම් පටිපාටියේ/පත්වීම් ලිපියේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ අවස්ථා ගණන සලකා ඒ මත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු නියමිත වාර ගණන ගණනය කරනු ලබයි |
| **ii** | පූර්ව තනතුරට අදාල බඳවා ගැනීම් පටිපාටියේ/පත්වීම් ලිපියේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නොවූ සංවර්ධන නිලධාරී සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නිලධාරීන් | නිලධාරියාට පෙනීසිටීමට හැකියාව තිබූ පූර්ව තනතුරට අදාල බඳවා ගැනීම් පටිපාටියේ/පත්වීම් ලිපියේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ අවස්ථා ගණන හා සංවර්ධන නිලධාරී සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ අවස්ථා ගණන සලකා ඒ මත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු නියමිත වාර ගණන ගණනය කරනු ලබයි. |
| **iii. පත්වීම ස්ථිර කිරීම සම්බන්ධ කරුණු** | පූර්ව තනතුරේ සේවය ස්ථිර නොකල නිලධාරීන්ගේ සේවය ස්ථිර කිරීම පිලිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානීන් තම නිර්දේශ යොමු කිරීමේදී නිලධාරියාගේ පත්වීම් දින සිට 2009.04.02 දක්වා නිර්දේශ ආයතන සංග්‍රහය අනුවද 2009.04.02 සිට පරිවාස කාලය අවසන් වන දින දක්වා නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති සංග්‍රහය අනුවද යොමු කල යුතුය. | |
| **iv. ශ්‍රේණිගත උසස්කිරීම සම්බන්ධ කරුණු** | a) නියමිත වාර ගණන තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමට අපොහොසත් වන නිලධාරීන්ගේ වාර්ෂික වැටුප් වර්ධක විලම්භනය වේ.<br>b) නියමිත වාර ගණන තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී ඇති නිලධාරීන් අනෙකුත් නියමිත සුදුසුකම් සපුරා තිබේනම් නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූ සේ සලකා පූර්ව සේවයට ඇතුළත් වී වසර 10ක සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දින සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබේ. | |

**සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ට සේවා ව්‍යවස්ථාවේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සම්පූර්ණ කිරීම සඳහා සහන සැලසීම**

**2 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

| 3. සංවර්ධන නිලධාරීන් සඳහා වන 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා සහන ලබා දීම | | |
|---|---|---|
| **සහන ලබාදීමට අදාල නිලධාරී කාණ්ඩය** | | **සහනය** |
| I | පූර්ව තනතුරේ/සේවයේ II ශ්‍රේණියේ තනතුරක සේවය කරන ලදුව සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන් | පූර්ව තනතුරේ/සේවයේ II ශ්‍රේණියේ තනතුරක/සේවයක සේවය කරන ලදුව 2011.08.01 දින සිට සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන්ට පෙනී සිටීමට හැකියාව තිබූ පූර්ව තනතුරට අදාල බඳවා ගැනීම් පටිපාටියේ/පත්වීම් ලිපියේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ අවස්ථා ගණන හා සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ අවස්ථා ගණන සලකා ඒ මත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු නියමිත වාර ගණන ගණනය කරනු ලබයි.<br><br>අන්තර්ග්‍රහණ ලිපිය නිකුත් කළ දින දක්වා කාලය තුළ පූර්ව තනතුරේ බඳවා ගැනීම් පටිපාටියෙහි/පත්වීම් ලිපියෙහි සඳහන් 2වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර තිබේනම් සංවර්ධන නිලධාරී සේවයේ IIශ්‍රේණියේ නිලධාරින් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් සමත්වීමේ අවශ්‍යතාවක් නොමැත. |
| ii | පූර්ව තනතුරේ/සේවයේ III ශ්‍රේණියේ තනතුරක සේවය කරන ලදුව සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන් | පූර්ව තනතුරේ/සේවයේ III ශ්‍රේණියේ ශ්‍රේණියේ තනතුරක/සේවයක සේවය කරන ලදුව 2011.08.01 දින සිට සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන්ට 2වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කිරීම සඳහා අන්තර්ග්‍රහණ ලිපිය නිකුත් කල දින සිට වසර 3 ක් ඇතුළත සම්පූර්ණ කිරීමට අවස්ථාව සැලසෙන අතර අන්තර්ග්‍රහණ ලිපිය නිකුත් කල දින සිට පවත්වන ලද සංවර්ධන නිලධාරී සේවයේ 2වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ අවස්ථා ගණන සලකා ඒ මත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු නියමිත වාර ගණන ගණනය කරනු ලබයි.<br><br>අන්තර්ග්‍රහණ ලිපිය නිකුත් කළ දින දක්වා කාලය තුළ පූර්ව තනතුරේ බඳවා ගැනීම් පටිපාටියෙහි/පත්වීම් ලිපියෙහි සඳහන් 2වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර තිබේනම් සංවර්ධන නිලධාරී සේවයේ IIශ්‍රේණියේ නිලධාරින් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් සමත්වීමේ අවශ්‍යතාවක් නොමැත. |

| | | |
|---|---|---|
| **iii** | සංවර්ධන නිලධාරී සේවයේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලදුව 2011.08.01 දිනට පසු දිනෙක සිට ක්‍රියාත්මක වන පරිදි සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියට උසස් කර ඇති නිලධාරීන් | මෙම නිලධාරීන් උසස් කිරීමේ ලිපිය නිකුත් කල දින සිට වසර 3 ක් ඇතුළත 2වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කිරීමට අවස්ථාව සැලසෙන අතර සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්ට පෙනී සිටීමට අවස්ථාව තිබූ සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන් සඳහා වන 2වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ අවස්ථා ගණන සලකා ඒ මත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු නියමිත වාර ගණන ගණනය කරනු ලබයි.<br><br>අන්තර්ග්‍රහණ ලිපිය නිකුත් කළ දින දක්වා කාලය තුළ පූර්ව තනතුරේ බඳවා ගැනීම් පටිපාටියෙහි/පත්වීම් ලිපියෙහි සඳහන් 2වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර තිබේනම් සංවර්ධන නිලධාරී සේවයේ IIශ්‍රේණියේ නිලධාරින් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් සමත්වීමේ අවශ්‍යතාවක් නොමැත. |
| **iii. ශ්‍රේණිගත උසස්කිරීම සම්බන්ධ කරුණු** | a) නියමිත වාර ගණන තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමට අපොහොසත් වන නිලධාරීන්ගේ වාර්ෂික වැටුප් වර්ධක විලම්භනය වේ.<br>b) නියමිත වාර ගණන තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී ඇති නිලධාරීන් අනෙකුත් නියමිත සුදුසුකම් සපුරා තිබේනම් නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූ සේ සලකා පූර්ව සේවයට ඇතුළත් වී වසර 10ක සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දින සිට I ශ්‍රේණියට උසස් කරනු ලැබේ. | |